# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,142 - 2019 සැප්තැම්බර් මස 20 වැනි සිකුරාදා - 2019.09.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 1624 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත 2019 සැප්තැම්බර් මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 ඔක්තෝබර් මස 11 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 සැප්තැම්බර් මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1623 - B 81562 — 5,403 (2019/09)
F 1 -

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2019

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණිය/සත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණිය/ජනපද නිලධාරී III ශ්‍රේණිය යන තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා මධ්‍යම පළාත තුළ පදිංචි සුදුසුකම්ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *පොදු සුදුසුකම් :-*

1.1 අයදුම්කරු ශ්‍රී ලාංකික විය යුතු ය.

1.2 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට (2019.10.04) පූර්වාසන්නයෙන් වූ වසර 03 ක කාලය තුළ මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (අයදුම්කරු මෙම පළාතේ වසර 03 ට වඩා ස්ථිර පදිංචි අයෙකු සමග විවාහ වූ විට කලත්‍රයාගේ ස්ථිර පදිංචිය සලකා බැලේ.)

1.3 අයදුම්පත් භාරගන්නා අවසන් දිනට (2019.10.04) වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය. (දැනටමත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුතු නිලධාරීන්ට මෙම උපරිම වයස් සීමාව බල පවත්වනු නොලැබේ.)

1.4 අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

1.5 සෑම අයදුම්කරුවෙකුම මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

2. *අධ්‍යාපන සුදුසුකම් හා තාක්ෂණ සුදුසුකම් :-*

සියලු අධ්‍යාපන සුදුසුකම් හා තාක්ෂණික සුදුසුකම් 2019.10.04 දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

| *තනතුර* | *අ.පො.ස. (සා/පෙළ) සුදුසුකම්* | *අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම්* | *තාක්ෂණික සුදුසුකම්* |
|---|---|---|---|
| කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණිය | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව විද්‍යාව, ගණිතය සහ තවත් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය එකවර සමත්ව තිබීම | ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, සත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව, ජෛව පද්ධති තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයයන්ගෙන් විෂයයන් දෙකක් සහිතව විද්‍යා/තාක්ෂණවේදය විෂය ධාරාවන් යටතේ සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර) එකවර සමත්ව තිබීම හෝ පැරණි විෂය නිර්දේශය යටතේ මෙහි සඳහන් විෂයන් 02 ක් සහිතව විෂයන් 03 කින් එකවර සමත්ව තිබීම. | තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික වෘත්තීය කුසලතා (NVQ) හය (06) මට්ටමේ කුසලතා සහතිකයක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබිය යුතුය.<br>i. කුණ්ඩසාලේ, අගුණකොළපැලැස්ස, පැල්වැහැර, බිබිල, ලබුදූව, වාරියපොළ, වව්නියාව, අනුරාධපුරය, කරපිංච යන කෘෂිකර්ම විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ දෑවුරුදු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, හෝ<br>ii. හාඩි කාර්මික ආයතනයෙන් කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, හෝ<br>iii. ඇක්වයිනාස් විද්‍යාලයේ කෘෂිකර්මය ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, හෝ<br>iv. රජය විසින් අනුමත ආයතනයක් මගින් පිරිනමනු ලබන දෑවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම. |

| *තනතුර* | *අ.පො.ස. (සා/පෙළ) සුදුසුකම්* | *අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම්* | *තාක්ෂණික සුදුසුකම්* |
|---|---|---|---|
| ජනපද නිලධාරී III ශ්‍රේණිය | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව විද්‍යාව, ගණිතය සහ තවත් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය එකවර සමත්ව තිබීම | ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, සත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව, ජෛව පද්ධති තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව, යන විෂයයන්ගෙන් විෂයන් දෙකක් සහිතව විද්‍යා/තාක්ෂණවේදය විෂය ධාරාවන් යටතේ සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර) එකවර සමත්ව තිබීම හෝ පැරණි විෂය නිර්දේශය යටතේ මෙහි සඳහන් විෂයන් 02 ක් සහිතව විෂයයන් 03 කින් එකවර සමත්ව තිබීම. | තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණ කරනු ලබන පරිදි ජාතික වෘත්තීය කුසලතා <u>(NVQ) පහ (05) හෝ හය (06) මට්ටමේ කුසලතා සහතිකයක්</u> අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබිය යුතුය.<br><br>i. කුණ්ඩසාලේ, අගුණකොළපැලැස්ස, පැල්වැහැර, බිබිල, ලබුදූව, වාරියපොළ, වව්නියාව, අනුරාධපුරය, කරපිංච යන කෘෂිකර්ම විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ දැවුරුදු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, හෝ<br><br>ii. හාඩි කාර්මික ආයතනයෙන් කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, හෝ<br><br>iii. ඇක්වයිනාස් විද්‍යාලයේ කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, හෝ<br><br>iv. රජය විසින් අනුමත ආයතනයක් මගින් පරිනමනු ලබන දැවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම. |
| සත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණිය | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය, සහ තවත් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය එකවර සමත්ව තිබීම. | ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, සත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව, ජෛව පද්ධති තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව, යන විෂයයන්ගෙන් විෂයන් දෙකක් සහිතව විද්‍යා/තාක්ෂණවේදය විෂය ධාරාවන් යටතේ සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි හැර) එකවර සමත්ව තිබීම හෝ පැරණි විෂය නිර්දේශය යටතේ මෙහි සඳහන් විෂයයන් 02 ක් සහිතව විෂයයන් 03 කින් එකවර සමත්ව තිබීම. | තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ජාතික වෘත්තීය කුසලතා <u>(NVQ) පහ (05) හෝ හය (06) මට්ටමේ කුසලතා සහතිකයක්</u> අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබිය යුතුය.<br><br>1. වැලිසර ශ්‍රී ලංකා සත්ව පාලන විද්‍යාලය මඟින් නිකුත් කළ දැවුරුදු ඩිප්ලෝමා සහතිකය, හෝ<br><br>2. අනුරාධපුර/සීප්පුකුලම සත්ව පාලන පුහුණු මධ්‍යස්ථානය මඟින් නිකුත් කරනු ලබන දැවුරුදු ඩිප්ලෝමා සහතිකය, හෝ<br><br>3. කරඳගොල්ල ශ්‍රී ලංකා සත්ව පාලන විද්‍යාලය මගින් නිකුත් කරනු ලබන දැවුරුදු ඩිප්ලෝමා සහතිකය. |

3. *වැටුප් පරිමාණය :*

රා.ප.ච. 03/2016 අනුව (MN3-2016) වැටුප් කේතයට අදාළ, රු. 31,040 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 57,550 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 දරන චක්‍රලේඛයේ උපලේඛන අංක II හි සඳහන් පරිදි ගෙවීම් සිදු කරනු ලැබේ.

4. *බඳවා ගැනීමේ කොන්දේසි :-*

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති බඳවා ගැනීමේ පරිපාටි අනුව බඳවා ගැනීමේ කොන්දේසි තීරණය වේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හි විධිවිධාන පරිදි දිස්ත්‍රික් ජනගහණ අනුපාතය අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. මේ සඳහා මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ලකුණු ප්‍රමුඛතාවය මත සුදුස්සන් තෝරා ගැනේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමක් සිදු නොවන අතර ලිඛිත විභාගයේදී එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා 40% අවම ලකුණු ප්‍රමාණයක් ලබා නොගන්නා අයැදුම්කරුවන්ට බඳවා ගැනීම සඳහා සලකා බලනු නොලැබේ. එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩි ලකුණු ලබාගත් අයැදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණු ප්‍රමාණවල එකතුව අනුව බඳවා ගැනීම සඳහා වූ ප්‍රමුඛතා ලේඛනය සකස් කෙරේ.

6. *සේවා කොන්දේසි.-*

6.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ.

6.2 අදාළ පත්වීම රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් නිකුත්කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අදාළ අනෙකුත් චක්‍රලේඛවල සඳහන් විධිවිධානවලට යටත්වේ.

6.3 මෙම තනතුරට පත් කිරීමෙන් අනතුරුව මධ්‍යම පළාත තුළ වසර 05 ක අවම සේවා කාලයක් අනිවාර්යයෙන් සේවය කළ යුතු අතර එම කාලය තුළදී මධ්‍යම පළාතෙන් පිටතට ස්ථාන මාරු ලබා ගැනීමට කරනු ලබන කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ. තව ද, පත් කරනු ලබන සේවා ස්ථානයේ වැඩ භාරගත් දින සිට අවුරුදු 3 ක අවම සේවා කාලයක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතුය.

7. *විභාග ක්‍රමය.-*

*(අ)* විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අයැදුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.
*(ආ)* අපේක්ෂකයා විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.
*(ඇ)* විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

8. *විභාග විෂය නිර්දේශය :*

මෙම තනතුරුවලට බඳවා ගැනීම සඳහා අයැදුම්කරුවන් පහත සඳහන් විෂයයන් හා විෂය නිර්දේශයන් යටතේ ලිඛිත විභාගයකට යොමු කරනු ලැබේ.

1. බුද්ධි පරීක්ෂණය :

කාලය පැය 01 යි. (ලකුණු 100) මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාව, විශ්ලේෂණ හැකියාව, කාල කළමනාකරණය විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. සියලුම තනතුරු සඳහා වන අයැදුම්කරුවන් පෙනී සිටිය යුතුය.

2. තාක්ෂණ ප්‍රශ්න පත්‍රය :

කාලය පැය 03 යි. (ලකුණු 100) තනතුරට අදාළව තාක්ෂණික දැනුම මැන බැලෙන බහුවරණ හා ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ.

*(අ)* මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණියේ තනතුරු සඳහා විෂය නිර්දේශය පහත පරිදි වේ.

අපේක්ෂකයාගේ තාක්ෂණික දැනුම මැන බැලීම සඳහා වූ ප්‍රශ්නවලින් සමන්විත වේ.
(විෂය නිර්දේශය පහත පරිදි වේ.)

(i) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකර්මාන්තයේ දායකත්වය
(ii) ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ දැනුම.
(iii) පස හා ශාක පෝෂණය
(iv) වී නිෂ්පාදනය.
(v) වෙනත් ක්ෂේත්‍ර භෝග නිෂ්පාදනය
(vi) එළවළු නිෂ්පාදනය
(vii) පළතුරු
(viii) බෝග ආරක්ෂණය
(ix) පාංශු රසායනය, පාංශු සංරක්ෂණයේ වැදගත්කම හා විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම
(x) වාරිමාර්ග ක්‍රම හා ජල කළමනාකරණය
(xi) ගොවිපල යාන්ත්‍රීකරණය
(xii) මී මැසි පාලනය
(xiii) මල් වගාව හා භූමි අලංකරණය
(xiv) ආරක්ෂිත භෝග වගාව
(xv) සත්ව පාලනය
(xvi) කෘෂිකාර්මික ව්‍යාප්තිය
(xvii) පටක රෝපණය
(xviii) පැලෑටි නිරෝධායනය පිළිබඳ දැනුම
(xix) (අ) ශාක සංරක්ෂණයේ වැදගත්කම (ශාක/ජාන ප්ලාස්ම)
(ආ) ශාක සංරක්ෂණ ක්‍රම (ශාක/ජාන ප්ලාස්ම)
(xx) ජාන තාක්ෂණය
(xxi) කෘෂිකර්ම සංවර්ධනය
(xxii) වර්තමාන කෘෂිකර්ම සංවර්ධන ප්‍රතිපත්ති, ඒවායේ ඇති වැදගත් කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන්, කෘෂිකර්ම සංවර්ධනය සම්බන්ධ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා වෙනත් ආයතන, මධ්‍යම රජයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ආයතන, මධ්‍යස්ථාන, අංශ, ඒකක හා ඒවායේ කාර්යභාරය. කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වර්තමාන ගැටළු හා අභියෝග, කෘෂිකාර්මික සංවර්ධනය රටේ සංවර්ධනයට ආධාර වන ආකාරය.

*(ආ)* මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ ජනපද නිලධාරි III ශ්‍රේණියේ තනතුරු සඳහා විෂය නිර්දේශය පහත පරිදි වේ.

I. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකර්මාන්තයේ දායකත්වය

i. දළ ජාතික නිෂ්පාදනයට කෘෂිකර්මාන්තයේ දායකත්වය
ii. රැකියා නියුක්තිය
iii. කෘෂිකර්මාන්තයේ අපනයන ආනයන තත්ත්වය

II. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ දැනුම
III. පස සහ ශාක පෝෂණය

i. පසේ ව්‍යුහය හා වයනය, භෞතික හා රසායනනික ලවණතාවය හා භෝග වගාව කෙරෙහි එහි බලපෑම
ii. ශාක පෝෂණය, පාංශු ශාක පෝෂණ කළමනාකරණය
iii. පැළෑටි පෝෂණය පිළිබඳ විශේෂ කරුණු

IV. පාංශු රසායනය, පාංශු සංරක්ෂණයේ වැදගත්කම හා විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම
V. වාරි මාර්ග ක්‍රම හා ජල කළමනාකරණය

i. විවිධ භෝග වර්ග සඳහා උචිත ජල සම්පාදන ක්‍රම හා ඒවායේ ජල කළමනාකරණය
ii. ක්ෂුද්‍ර ජල කළමනාකරණ ක්‍රම
iii. ජල වහනය හා එහි වැදගත්කම

VI. ශ්‍රී ලංකා ජනපද ව්‍යාපාර හා මහවැලි ව්‍යාපාරය පිළිබඳ දැනුම

i. ජනපද ව්‍යාපාර පිහිටුවා ඇති ස්ථාන
ii. මහවැලි ව්‍යාපාරයට අයත්වන ප්‍රදේශ

VII. ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම පිළිබඳ දැනුම
VIII. සිතියම් ආශ්‍රිත කරුණු පිළිබඳ දැනුම

(i) අනිලමානය, ඩම්පි ලෙවලය, තියෝඩර්ලයිටරය (විකෝනමානය)
(ii) 1:50,000, 1:10,000, අඟලේ සිතියම් හා අවසාන ගම් පිඹුර පිළිබඳ විස්තර

IX. ශ්‍රී ලංකාවේ දැනට පවතින ඉඩම් පිළිබඳ හා ඒ සම්බන්ධ දෙපාර්තමේන්තු, ආයතන පිළිබඳ දැනුම -

ඉඩම් වර්ග - රජයේ ඉඩම්
පුද්ගලික ඉඩම්
ප්‍රවේණි ඉඩම්

X. ඉඩම් සංවර්ධනය හා බෙදාදීම පිළිබඳ දැණුම -

(i) වර්තමානයේ ඉඩම් සංවර්ධනය හා බෙදාදීම සම්බන්ධ ක්‍රියාත්මක ජාතික වැඩසටහන් පිළිබඳ අවබෝධය -

- ඉඩම් නොමැති පුද්ගලයන් හඳුනා ගැනීම
- බිම් සවිය වැඩ සටහන
- ඉඩම් කැබලි ලක්ෂයේ වැඩ සටහන

XI. රජ සමයේ සිට මේ දක්වා ඉඩම්වල අයිතිය බැහැර කිරීමට යොදාගත් ලේඛන පිළිබඳ අවබෝධය -

(i) සන්නස්, නින්දගම්, බදුකර, ස්වර්ණ භූමි, රත්න භූමි, රන්බිම

(ඇ) මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණියේ තනතුර සඳහා :

තනතුරට අදාළව තාක්ෂණික දැනුම මැන බැලෙන කෙටි හා ව්‍යුහගත ප්‍රශ්නවලින් සමන්විත වේ.

9. *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :*

යම් අයැදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම් ලැබීමට පෙර හෝ පත්වීම් ලබාදීමෙන් පසු හෝ ඕනෑම අවස්ථාවක දී අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය හෝ පත්වීම අවලංගු කෙරෙනු ඇත. එසේම දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

10. *විභාග ගාස්තු :*

විභාග ගාස්තු රු. 600 කි. මෙම මුදල මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවෙන පරිදි මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන රිසිට්පත අයැදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබාගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

11. *අයැදුම් කළ යුතු ක්‍රමය :*

*(අ)* අයැදුම්පත්‍ර A4 (සෙ. මී. 21x29) (සාමාන්‍ය හාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසි භාවිත කරමින්,

I. අංක 01 සිට 03 තෙක් පළමුවන පිටුවට ද,
II. අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද, ඇතුළත් වන සේ, අයැදුම් පත්‍රය පිළියෙල කරගත යුතුය.
III. එක් තනතුරකට වඩා වැඩි තනතුරු සංඛ්‍යාවකට අයැදුම් කරන්නේ නම් එක් එක් තනතුරට වෙන වෙනම අයැදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
IV. ආදර්ශ අයැදුම්පත්‍රයට අනුකූල නොවන අයැදුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයැදුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. එම අයැදුම්පත්‍රයේ ඡායා පිටපතක් අයැදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත්

වේ. තව ද සම්පූර්ණ කරනු ලබන අයැදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයැදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයැදුම්කරු විසින් සැලකිලිමත් විය යුතුය. එසේ නොවුනහොත් අයැදුම්පත්‍රය ප්‍රතික්ෂේප කෙරේ. අයැදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයැදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයැදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

*(ආ)* ආදර්ශ අයැදුම්පත්‍රය www.psc.cp.gov.lk වෙබ් අඩවියෙන් බාගත කරගත හැක.

*(ඇ)* විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද අයැදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2019 ඔක්තෝබර් මස 04 වැනි දින හෝ ඊට කලින් පහත ලිපිනයට එවිය යුතුය.

'ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.'

අයැදුම්පත්‍රය බහා ඇති කවරයේ වමත් පස ඉහළ කෙළවරේ පැහැදිලිව **"මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තනතුරු සඳහා බඳවාගැනීම - 2019"** යනුවෙන් සඳහන් කළ යුතුය. අයැදුම්පත් භාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන කිසිම අයැදුම්පතක් භාරගනු නොලැබේ.

*(ඈ)* දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ සිටින නිලධාරීන් අයැදුම්පත්‍රයේ අංක 13.0 ශීර්ෂය යටතේ තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සහතික කරන ලද අයැදුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

12. විභාග මධ්‍යස්ථාන පිළිබඳව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් අයැදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍රය මගින් දැනුම් දෙනු ලැබේ. අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් පළ කරනු ඇත. එම නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් නිවේදනයේ සඳහන් ආකාරයට ඒ බව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයැදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතක් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ෆැක්ස් මගින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

13. අයැදුම්කරු විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවාගත යුතු අතර විභාග දිනයේ ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුත්තේ එසේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයයි. අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.

14. අයැදුම් පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ රු. 2,40,360/= කට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

15. කිසියම් අපේක්ෂකයෙකු වෙත විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

16. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

17. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

18. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කළ යුතුය.

එම්. ජී. ඒ. තිලකරත්න,
ලේකම්,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2019 අගෝස්තු මස 03 වැනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ දී ය.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

ආදර්ශ අයැදුම්පත්‍රය

*මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2019*

*විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :*

සිංහල - S
දෙමළ - T
ඉංග්‍රීසි - E
(අදාළ සංකේතය කොටුව තුළ ලියන්න.)

*ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :*

මහනුවර - 01
මාතලේ - 02
නුවරඑළිය - 03
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

ඉල්ලුම් කරන තනතුර : (අදාළ සංකේතය කොටුව තුළ ලියන්න.)

කෘෂිකර්ම උපදේශක - AI
සත්ව සංවර්ධන උපදේශක - LDI
ජනපද නිලධාරි - CO

1.0

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : ..............................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) උදා : PERERA, A.B.C.

1.2 සම්පූර්ණ නම : ..............................
..............................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම : ..............................
..............................
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

2.0

2.1 ස්ථිර ලිපිනය : ..............................
..............................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය : ..............................
..............................
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය : ..............................
..............................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.4 දුරකථන අංකය : | | | | | | | | | | |

3.0

3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

පුරුෂ - 0
ස්ත්‍රී - 1

3.2 උපන් දිනය : වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

3.3 2019.10.04 වැනි දිනට වයස : අවුරුදු :......................, මාස :......................, දින :...................

04. අයැදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :..........................................................

| *ඡන්ද හිමි නාම ලේඛණයට අනුව පදිංචිය* | *2016* | *2017* | *2018* |
|---|---|---|---|
| මැතිවරණ කොට්ඨාසය | | | |
| ඡන්ද ප්‍රදේශය | | | |
| ඡන්ද කොට්ඨාසය | | | |
| ග්‍රාම නිලධාරී කොට්ඨාස අංකය | | | |
| ගෘහ අංකය | | | |
| නමට ඉදිරියෙන් ඇති පිළිවෙල අංකය | | | |

5.0 අධ්‍යාපන සුදුසුකම් :

5.1 අ.පො.ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර :

(I) විභාගයේ වර්ෂය හා මාසය : .............................
(II) විභාග අංකය : .................
(III) ප්‍රතිඵල :

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. ගණිතය | | 6. | |
| 2. විද්‍යාව/විද්‍යාව හා තාක්ෂණවේදය | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

(I) විභාගයේ වර්ෂය හා මාසය : .............................
(II) විභාග අංකය : ..................
(III) ප්‍රතිඵල :

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |

6.0 *තාක්ෂණ සුදුසුකම් :*

| *ආයතනය* | *හදාරා ඇති පාඨමාලාව* | NVQ *මට්ටම* | *කාල සීමාව* | *සාමාර්ථය* | *සහතික පත් අංකය හා දිනය* |
|---|---|---|---|---|---|
| | | | | | |

7.0 වෙනත් සුදුසුකම් : ..........................................................................................................................................
..........................................................................................................................................

8.0 දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූවකු නම්,

8.1 දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ලිපිනය : ..........................................................................................................
..........................................................................................................................................

8.2 දැනට දරන තනතුර : ..........................................................................................................

8.3 සේවා කාලය : ..........................................................................................................

8.4 ස්ථිර විශ්‍රාම වැටුප් හිමි හෝ තාවකාලික ද යන බව : ..........................................................................

9.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

ඔව් : ☐ නැත : ☐

(අදාළ කොටුවේ √ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.) :..........................................................................
..........................................................................................................................................

10.0 *විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :*

(I) විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : ..........................................................................................

(II) ලදුපත් අංකය හා දිනය : ..........................................................................................

(III) ගෙවූ මුදල : ..........................................................................................

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. |

11.0 *අයැදුම්කරුගේ සහතිකය :*

*(අ)* මෙම අයැදුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

*(ආ)* මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

*(ඇ)* තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

*(ඈ)* මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය :........................... ..........................................,
අයැදුම්කරුගේ අත්සන.

12.0 *අයැදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයැදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ................................................................................................. මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී .................................. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

දිනය : ................................ .................................................................,

අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : ......................................................................................
තනතුර : ...........................................................................................................................................
ලිපිනය : ..........................................................................................................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

13.0 *අයැදුම්කරු රජයේ/පළාත් රාජ්‍ය සේවාවේ නියුතු අයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :-*

.................................................................................................................. මයා/මිය/මෙනවියගේ අයැදුම්පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ස්ථිර/ තාවකාලික/අනියම් පදනමින් සේවය කරන බවත් මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

............................................................................,

දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ බලය පවරනු ලැබූ නිලධාරියා.

දිනය : ..............................................................................................................................................
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : ...................................................................................
තනතුර : ...........................................................................................................................................
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව : ..........................................................................................

09-646

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.